# සංක්ෂිප්තය

මෙම අධ්‍යයනයේ තේමාව වූයේ මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය කිරීමේදී පෙර පාසල් වල දෛනික ක්‍රියාවලියේ දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් යන්නයි.

පෙර පාසල්වල දෛනික ක්‍රියාවලිය තුළින් මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය වනවාද යන්න පිළිබඳව විමසා බැලීම කෙරෙහි මෙම අධ්‍යයනය යොමු වී ඇත.

ඒ සඳහා අධ්‍යයන අරමුණු 5 ක් ඔස්සේ මෙම අධ්‍යයනය මෙහෙය වන ලදී.

(1) මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනයේ ස්වභාවය හඳුනා ගැනීම .

(2) නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය සඳහා පෙර පාසල් වැඩ සටහන් සංවිධානය වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම

(3) දෛනික වැඩ සටහන් වලදී නිර්මාණාත්මක කුසලතා සංවර්ධනයට යොමුවන ආකාරය අධ්‍යයනය කිරීම.

(4) නිර්මාණාත්මක කුසලතා සංවර්ධනයේදී ගුරුවරුන්ගෙන් සැපයෙන දායකත්වය හා ඔවුන්ට මුහුණ දීමට සිදුවන අභියෝග විමර්ශනය කිරිම.

(5) මුල් ළමාවියේ දරුවන්ගේ නිර්මාණාත්මක කුසලතා පිළිබඳ න්‍යායාත්මක කරුණු ඇසුරෙන් පෙර පාසල් දෛනික වැඩ සටහන තුළ නිර්මාණාත්මක කුසලතා සංවර්ධනය සඳහා සැපයෙන දායකත්වය විශ්ලේෂණය කිරීම එම අරමුණු විය.

කැලණිය අධ්‍යාපන කොට්ඨාසයේ ලියාපදිංචි පෙරපාසල් අතුරින් පෙර පාසල් 4 ක් සහේතුකව තෝරා ගෙන එහි ගුරුවරියන් 8 දෙනෙකුද, අහඹු ලෙස තෝරාගත් ළමයින් 12 දෙනෙකුද, පෙර පාසල් දෛනික ක්‍රියාවලිය දින තුන බැගින් , ද තෝරා ගැනිණ.. දත්ත එකතු කිරීම සඳහා අදාළ සාහිත්‍ය විමර්ශනය, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණ සහ ප්‍රත්‍යෝක අධ්‍යයන යොදා ගැනිණ. රැස් කරගත් දත්ත, ප්‍රතිශත, වගු, ප්‍රස්තාර යොදා ගනිමින් තේමා යටතේ විශ්ලේෂණයට භාජනය කරන ලදී.

අධ්‍යයනය මගින් අනාවරණය කරගත් ආකාරයට පෙර පාසල් ගුරුවරියන් වැඩි ප්‍රතිශතයක් කුමන හෝ අන්දමක පෙර පාසල් පුහුණුවක් ලබා ඇත. ගුරුවරුන්ගේ අධ්‍යාපන මට්ටම අඩුවන විට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් ප්‍රමාණය අඩු වන බව හෙළිවිය. දරුවන්ගේ ස්ව නිර්මාණ කෙරෙහි අවස්ථාව ලබා නොදෙන බවත් දෙමාපිය අපේක්ෂණය වී ඇත්තේ ලිවීම සහ

කියවීම ඉගැන්වීම පමණක් බවත් අනාවරණය විය. නව අදහස් හා උපායන් පංති කාමර නිර්මාණශීලිත්වය වැඩි දියුණු කිරීමට යොදා ගන්නේ ඉතා අඩුවෙන් බවත් හෙළිවිය. ගුරු සිසු අනුපාතය අඩු වන විට කළහැකි ක්‍රියාකාරකම් වැඩි වීමටත්, ළමයින් සහ එක්ව ක්‍රියාකාරකම් කිරීමට හොඳින් අවස්ථාව උදාවූ බව පැහැදිලි විය. කෙසේ වෙතත් සෑම පෙර පාසලකම කුමන හෝ අන්දමක නිර්මාණාත්මක ක්‍රියාකාරකම් ඉටුවන බව අනාවරණය විය. ගුරුවරුන්ගේ දැනුම හා නිර්මාණාත්මක හැකියාව යාවත්කාලීන කළ යුතු අතර ඔවුන් සඳහා වරින් වර සේවාස්ථ පුහුණු, වැඩ මුළු පැවැත්වීම යෝග්‍ය බව යෝජනා කෙරේ. පෙර පාසල් ක්‍රියාකාරීත්වය අභ්‍යන්තර හා බාහිර අධීක්ෂණයන්ට යටත් කිරීම හා වරින් වර ගුරු වැටුප් වැඩි කිරීම මගින් ඒවායේ ගුණාත්මකභාවය වැඩි කළ හැකි බව යෝජනා කරන ලදී.

ඉහත සඳහන් කර ඇති අකාරයට මෙම අධ්‍යයනයේ මෙහෙයවා ඇත.